# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1611/5 - 2009 ජූලි 20 වැනි සඳුදා - 2009.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක 08.

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20 (5) වන වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20 (5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම නිෂ්පාදකයෙකු, වෙළෙන්දකු ආනයනකරුවකු හෝ බෙදාහරින්නෙකු විසින් කිසිදු සම්පූර්ණ යොදය සහිත කිරිපිටි වර්ගයක් පහත දක්වා ඇති උපරිම සිල්ලර මිළට වැඩියෙන් වෙළඳාම් කිරීම, වෙළඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| | *උපරිම සිල්ලර මිළ* |
|---|---|
| | රු. ශ. |
| සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ග්‍රෑම් 400 පැකට්ටුව | 245.00 |
| සම්පූර්ණ යොදය සහිත කිරිපිටි කිලෝ ග්‍රෑම් 1 පැකට්ටුව | 600.00 |

ඉහත දක්වා ඇති ප්‍රමාණයේ සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ඇසුරුම් හැරුණු විට අනෙකුත් ප්‍රමාණ වල සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ඇසුරුම්, ග්‍රෑම් 100 ක් සඳහා රු. 60.00 ක මිළකට වැඩියෙන් විකිණීම නොකළ යුතු ය.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

රූමි මර්සූක්,
සභාපති.

2009 ජූලි මස 20 වැනි දින,
කොළඹ දී ය.

08-21


1A - G 11438— 580 (2009/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.